# Contested Space

# තරඟ වදින අවකාශ



සුනිල් විජේසිරිවර්ධන

**වරුණි අනුරුද්ධිකාගේ ඡායාරූප ප්‍රදර්ශනය**

**පෙබ: 16-18 හැරල්ඩ් පීරිස් ගැලරියේදී**

**Contested space** නමින් නම් කොට ඇති අපූරුතම ඡායාරූප ප්‍රදර්ශනයක් එය ගොඩනැගීමේ ක්‍රියාවලිය මැද්දේ, දකින්නට අවස්ථාවක් මට ලැබුණි. මෙම ඡායාරූප සරණියේ අවසාන නිමාව තවම මා නොදුටු නමුත්, දැනට මගේ අත්දැකීම ගැන සටහනක් තැබීම ඉදිරි නරඹන්නෙකුට ප්‍රයෝජනවත් විය හැකි යයි මම සිතමි.

වරුණි අනුරුද්ධිකා නම් තරුණ ඡායාරූප ශිල්පිනිය, 'උරුමය අධ්‍යනය කිරීම' සඳහා උනන්දු වන කුඩා කණ්ඩායමක් සමඟ එකතුව අත ගසා ඇත්තේ දුලබ, දුෂ්කර එහෙත් බෙහෙවින් රසවත් ව්‍යායාමයකටය යනු, ගොඩනැගෙන ඡායාරූප සරණිය දුටු මා සිතට පිවිසි මුල්ම අදහසයි. මේ සටහන තුළ මා උත්සාහ කරන්නේ මාගේ ඒ අදහස පැහැදිලි කිරීමටයි.

මේ ඡායාරූප සරණියේ විෂයය වන්නේ මිහින්තලය ද ඇතුළත් ඓතිහාසික අනුරාධපුරයයි. පුරාවිı/ පුජා බිම්වල ඡායාරූප ලාංකික ජීවන අවකාශය පුරා වැසි වසින කාලයක 'තරඟ වදින අවකාශ' නම් ඡායාරූප සරණිය විශේෂිතව කැපී පෙනෙන්නේ ඇයි?

ලංකාවේ පැරණි පුරාවිද්‍යා බිම් ලංකාව තුළ කලාත්මක ඡායාරූපකරණයට හසුවී ඇති ආකාර ගැන මෙනෙහි කරන විට වරුණිලාගේ ව්‍යායාමයේ දුලබ බව පහසුවෙන්ම ඇස ගැටේ. මහජන අවකාශය වෙතට පිවිසෙන පුරාණ උරුමය පිළිබඳ කලාත්මක ඡායාරූපකරණයේ අපට මේ දක්වා දක්නට ඇත්තේ හුදෙක් වර්ග දෙකක් පමණක් යැයි කිව හැකිය.

එක් වර්ගයක් නියෝජනය කරන්නේ අපගේ දේශීය පුවත්පත්, සඟරා, රූපවාහිනී තිර පුරා දක්නට ලැබෙන සුලබ වර්ගයයි; ජනප්‍රිය (අධිපති) ඉතිහාසකරණයට අනුරූපව, ඉතිහාස උරුමය වූකලී 'එක් සෙලකින් නෙළූ රුවක් සේ' ඒකමානීය, සරල, අභ්‍යන්තර 'විසංවාද' රහිත යමක් සේ ඉදිරිපත් කිරීමට එකී ඡායාරූප යුහුසුළු වෙති. මෙහිදී අපගේ උරුමයේ ප්‍රෞඪත්වය හා සංස්කෘතික දේපළවල සෞන්දර්යාත්මක විශිෂ්ඨත්වය වැනි කාරණා මතු කරනු ලබන්නේ, කුතුහලයකින් තොරව දෙන දේ බාරගන්නා එක්තරා ඉතිහාස කතිකාවකින් දනටත් තත්වාරෝපිත මනසකට ආමන්ත්‍රණය කරමිනි. එහිදී



උරුමය පිළිබඳ අපගේ අභිමානය පදනම් විය හැකි වඩාත් සංකීර්ණ හා පොහොසත් සාධක අපගේ අවධානයට ඇතුල් වන්නට ඉඩක් නොලබා පිට දොරටුවේදීම බැහැර කරනු ලබයි.

මෙම ඡායාරූපකරණයට සමගාමීව 'සංචාරක' ඇස් සඳහා ද සංස්කෘතික දේපළ ඡායාරූපයට නැගේ. එහිදී මුඛ්‍ය අරමුණ වන්නේ විදේශිකයා අමුතු, අපූරු දෙයින් පුදුමයට, ඇතැම් විට, ත්‍රාසයට පත් කිරීමයි. මෙහිදී ඡායාරූප ශිල්පියාගේ ඇස හා මනස වැඩ කරන්නේ කලින් කිව් ආරට අමුතු වන අයුරකින් නොවේ. මන්ද යත් මෙකී අවස්ථා

දෙකේදීම භාවිතාවන මනෝවිද්‍යාත්මක උපාය මාර්ගය මූලික වශයෙන් එකම වන බැවිනි; අවශ්‍ය වන්නේ සංකීර්ණ අරුත් සොයා යන විචාරාත්මක ගවේෂණයක් නොව, 'සංත්‍රාසවත්' ඉදිරිපත් කිරීමක් බැවිනි. ඓතිහාසික අනුරාධපුරයේ ඇතැම් 'පුරා වි:ා ස්ථාන' ඒ සමගම දේශීය බැතිමතුන්ගේ පූජා ස්ථාන ද වන්නෝය. එම ස්ථාන බැතිමතාගේ ඇස සඳහා කොහොමටත් ඡායාරූපයට නැගෙන්නේ ප්‍රශ්න අවුලන සුළු, ගවේෂණාත්මක ප්‍රවේශයකින් නොවේ. තත්වාරෝපිත, බාරගන්නා මනසකට උචිත ඉහත කී උපාය මාර්ගයට අනුරූපවමය.

මෙබඳු පසුබිමක් තුළ වරුණි සහ ඇගේ සගයින්ගේ ඡායාරූප ඇස ක්‍රියාත්මක වී ඇති ගවේෂණාත්මක ආකාරය දෙස බලන විට, එය ශ්‍රී ලංකාවේ කලාත්මක ඡායාරූපකරණයේ ඉතිහාසය තුළ දුලබ ව්‍යායාමයක් යැයි හැඳින්වීම ප්‍රමාණවත් ලෙස එය විස්තර කරන්නේදැයි නොදනිමි. මන්ද යත් එය එකී ඉතිහාසය තුළ මේ ගණයේ ප්‍රථම ව්‍යායාමය විය හැකි නිසාය.

වරුණිලාගේ මේ ව්‍යායාමය ඉතා දුෂ්කර එකක් ද වන්නේ යැයි මම කියූවෙමි. ඊට නම් ඇත්තේ එක හේතුවක් නොවේ. හේතු රාශියකි.

කලින් නොගිය පාරක් හෙළි කරමින් යෑමම දුෂ්කර වැඩකි. මේ දුෂ්කර කාර්යයේ මූලික පැති දෙකක් ඇත; ගවේෂණයට අයිති ශාස්ත්‍රීය සංකල්ප පැත්ත හා ඡායාරූපකරණය හා අදාළ තාක්ෂණික/කලාත්මක අභියෝගයන් පිළිබඳ පැත්තයි. ඒ දෙපැත්තම අලුත් පාරවල්ය.



ඉතිහාසය පිළිබඳ ඌණිත හා අධිපතිවාදී ගොඩනැගීම්වලින් හාත්පස සමාජ විඥානය බලගතු බලපෑම්වලට ලක්වන කාලයක උඩු ගං බලා පිහිනීම පහසු නැත. රළ පහර සැරය. මින් අදහස් කෙරෙන්නේ, එක් පසෙකින් දැනට එකතු වී ඇති පුරා විද්‍යා හා ඉතිහාස දත්ත, සමීපව කියැවීමේ ඉතා දුෂ්කර අභ්‍යාසයක් මෙහිදී අවශ්‍ය කෙරෙන බවය.

එම කියැවීම් සඳහා දැනට තහවුරුව පවතින 'සුසමාදර්ශවලින්' නිදහස් වී, නව සුසමාදර්ශ ගොඩනගා ගත හැකිද? සමහර විට අමාරුම අභියෝගය ඇත්තේ මෙතනයි; සංකල්පීය වශයෙන් 'අනන්‍යතාවය', 'සම්ප්‍රදායය', 'සංස්කෘතික උරුමය' වැනි සංකල්ප ගොඩ නගා ඇති ජනප්‍රිය සුසමාදර්ශ රාමුවේ ඒකමාන- පැතලි- වියළි ස්වභාවයන් දෙස බලන විට මෙබඳු ගවේෂණයකදී 'සුසමාදර්ශ පිම්මක්' සඳහා ගවේෂණ මනස සූදානම් විය යුතුය. එය දුෂ්කර පිම්මකි.

උදාහරණයකට 'සම්ප්‍රදායය' යන සංකල්පය දෙස බලමු. 'සම්ප්‍රදායය' ජනප්‍රිය මෙන්ම ඇතැම් විදග්ධ කතිකාවන් තුළ පවා සංකල්පගත වන ආකාරය පහත දක්වෙන රූප සටහන මගින් මූලික වශයෙන් චිත්‍රණය කළ හැකි යැයි සිතමි.

---

අතීතය ⟶ වර්තමානය ⟶ අනාගතය

---

සම්ප්‍රදායය විදග්ධ කතිකාවන් තුළ පවා සැලකෙන්නේ ගඟක් වැනි ප්‍රවාහයක් ලෙසටය. (ගුණදාස අමරසේකරගේ 'සිංහල කාව්‍ය සම්ප්‍රදායය' නම් ග්‍රන්ථයේ පිට කවරයේ චිත්‍රය මේ සංකල්පගත කිරීම මහජන අවකාශයට ඉදිරිපත් කිරීම පිළිබඳ මනා නිදසුනක් සපයයි.)

එහි 'ඉවුරු දෙක' එකී සම්ප්‍රදායය 'අනෙක්' සම්ප්‍රදායයන්ගෙන් වෙන් කරන සීමා මායිම් ලකුණු කරයි. මෙම ප්‍රදර්ශනය මූලික වශයෙන්ම අක්ෂ කොට ගන්නේ කාලයයි; කාල ප්‍රවාහයයි. ඊට අනුව සම්ප්‍රදායයක් යනු පැහැදිලි සීමා ඉවුරු තුළ අතීතයේ සිට ගලා එන කිසියම් ප්‍රවාහයක් ලෙස ඉදිරිපත් වේ.

ගඟක අනුරුව සහිත සම්ප්‍රදායය පිළිබඳ මෙම ආදර්ශන ගොඩනැගීමම ගත්තත්, 'ගඟ' යනු මීට වඩා සංකීර්ණ ප්‍රවාහයක් බව පෙනී යා යුතුය.



ඉහත රූප සටහන පෙන්වන පරිදි ගඟක් යනු ශාඛා, ප්‍රශාඛා, අතු ගංගා අනවරතව එක් වෙමින් නිර්මාණය කෙරෙන ප්‍රවාහයකි. එහි ඉවුරු අර තරම්ම දෘඪ නැත. තැන් තැන්වල ඉවුරු තවත් ප්‍රවාහයන්ට විවෘත වේ. සම්ප්‍රදායයක් සම්බන්ධයෙන් ද ගඟේ අනුරුව යම් තාක් දුරට භාවිතා කළ හැකි බව පහසුවෙන් පෙනී යයි. එවිට ගඟක මෙන්ම සම්ප්‍රදායයක ද 'සම්භවය' නොව 'සම්භවයන්' ගැන කතා කරන්නට සිදුවෙයි.

එහෙත් 'සම්ප්‍රදායයක යථාව' ගඟකින්, කොතරම් ගැඹුරට නිරූපණය කළ හැකිද? 'ගඟක්' අනුරුව ලෙස ගන්නා ආදර්ශනයේ අතිමූලික දුබලතාවය නම් සම්ප්‍රදායයේ වාහකයා කතෘකයා ගැන කිසිදු නිනව්වක් එය නොපෙන්වීමයි. සම්ප්‍රදායය, ඊට අනුව, මිනිසුන්ගේ කිසිදු සහභාගිත්වයක් නැතිව, තමාම අතීතයේ සිට වර්තමානය හරහා අනාගතය කරා ගලා බසිනවා මෙනි!

'සම්ප්‍රදායයක්' සත්‍ය වශයෙන් ක්‍රියාත්මක වන්නේ වාහකයින් හෙවත් මිනිසුන් හරහාය. එකී මිනිසුන්ගේ ජීවිතය ධාවනය වන්නේ කාලය තුළ පමණක් නම් නොවේ; අවකාශය ද හරහාය. මින් අදහස් වන්නේ මිනිස්සු පොළව උඩ ඇවිදින අතර 'අනෙකා' ව නිරන්තරයෙන් මුණගැසෙන බවයි. නොහොත් වාහකයාගේ ජීවිතය පවතින්නේ **'සම්ප්‍රදායයක් තුළ'** පමණක් නොවේ. තමන්ගේ අවකාශය තුළ ක්‍රියාත්මක වන **'සම්ප්‍රදායයන් අතර'** ය.

උදාහරණයක් ලෙස ශ්‍රී රාහුල හිමියන් කලාපීය භාෂා ගණනාවක්ම

දැන සිටියේය යන්නෙහි තේරුම, උන්වහන්සේ හරහා සිංහල භාෂා සම්ප්‍රදායය ගලන්නේ 'අනෙක්' භාෂා සම්ප්‍රදායයන්ගේ ස්පර්ශයට නොහොත් බලපෑමට ලක්වෙමින් බවයි. තත්වය එසේ නම් සම්ප්‍රදායය 'ඉවුරු' ගැන අලුතින්ම සිතන්නට සිදුවේ. නව සුසමාදර්ශී ගැටළුව නම් ඒ ඉවුරු ඉවුරු ද යන්නයි. මන්ද යත් සෑම වාහකයෙකුම 'ඉවුරු විවෘත' කිරීමේ ශක්‍යතාවයකින් යුක්තයි.



දැන් නැවත 'තරඟ වැදෙන අවකාශ' ඡායාරූප ප්‍රදර්ශනය දෙසට යොමුවන්නේ නම් පෙන්වා දිය හැකි කරුණක් වන්නේ එකී ඡායාරූප සරණිය යට කී 'ඉවුරු' අතිශයින් ගතික හා විචල්‍ය යමක් බව ඉඟි කරන බවය. ඉතින් එසේ කිරීම පහසු කාර්යයක් නම් නොවේ.

දුෂ්කරතාවය අනිත් අතට ඇත්තේ ඡායාරූප කලාවේ ස්වභාවය පිළිබඳ ප්‍රශ්නය තුළය. ඡායාරූපයකට සංකල්ප ගොඩ නැගිය නොහැකි නමුත් ප්‍රශ්න මතු කළ හැකිය. එය මේ ප්‍රදර්ශනය මනාව තහවුරු කරයි. එම දුෂ්කර කාර්යය සඳහා කළ ඡායාරූප ගවේෂණය රසවත් ව්‍යායාමයක් විය යුතු බව අමුතුවෙන් පෙන්වා දිය යුතු නොවේ. මනුෂ්‍ය ජීවිතයේ රසවත්ම දෙය, නොදන්නා ඉසව්වකට පියමං කොට 'දැනගැනීමෙන්' ලබා ගන්නා ආශ්වාදය විය යුතුය.

ඉදින් මා සිතන්නේ, මෙම ඡායාරූප සරණිය ගොඩනැගූ කණ්ඩායමට මෙන්ම මෙය කියවන්නාට ද එය දුලබ දුෂ්කර හා රසවත් ව්‍යායාමයක් වීම නිසැක බවයි. මගේ අත්දැකීම නම් එයයි.